# 11. මිතුරෙකුගෙන් ලිපියක්



## නිවැරදිව රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලියමු.

**රාජකාරි / ව්‍යාපාරික ලිපි යනු,**

රාජකාරීමය කටයුත්තක් හෝ ව්‍යාපාරික කටයුත්තක් සඳහා යම්කිසි ආයතනයකට ලියනු ලබන ලිපි රාජකාරි / ව්‍යාපාරික ලිපි වශයෙන් හැඳින්වේ.

මෙම ලිපි ලිවීමේදී අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග කිහිපයකි.

- සිංහල ව්‍යාකරණානුකූලව ලිපිය ලියයි.
- ලිපිය දෙපස තීරුවල අදාළ ඉඩ ප්‍රමාණ තැබිය යුතුය(ගොනුකිරීමේ පහසුව සඳහා)
- ලිපියේ ක්‍රමානුකූල බව හා පිරිසිදු බව රැකගැනීම.
- කෙටි සරල වාක්‍ය හා වචන භාවිත කිරීම.
- විරාම ලක්ෂණ නිසි පරිදි යෙදීම.
- කිව යුතු දේ පැහැදිලිව කෙටියෙන් සඳහන් කළ යුතුය.
- එක් මූලික කරුණක් සඳහා එක් ඡේදයක් බැගින් ලිවිය යුතුය.
- ලිපිය කියවන්නා ලිපිය කියවූ පසු ඒ සම්බන්ධයෙන් කුමක් කළ යුතුදැයි යොමු කිරීමක් කළ යුතුය.
- ලිපිය විවෘත කළ විගස කුමන විෂයක් සම්බන්ධ ලිපියක් දැයි දැනගත හැකි විය යුතුය.

**රාජකාරි / ව්‍යාපාරික ලිපියක කොටස්**

1. යවන්නාගේ නම, තනතුර, ලිපිනය හා දිනය
2. ලබන්නාගේ තනතුර හා ලිපිනය
3. ආමන්ත්‍රණය
   - මහත්මයාණෙනි / මහත්මියනි
   - ගරු මැතිතුමණි
   - අධිකාරීතුමා
   - කළමනාකාරතුමනි / තුමියනි
   - විහාරාධිපති
4. මාතෘකාව ( කෙටියෙන්)
5. අන්තර්ගතය (විස්තරය)
6. අවසානය
   - මෙයට විශ්වාසී
   - මෙයට සේවා ලැදි
7. අත්සන

ඩබ්.එම්.එස්.එල්.ජයසිංහ

## <u>රාජකාරී / ව්‍යාපාරික ලිපියක ආකෘතිය</u>

1. යවන්නාගේ නම,තනතුර හා දිනය

2. ආමන්ත්‍රණය

3. මාතෘකාව
4. අන්තර්ගතය(විස්තරය)

5. අවසානය
6. අත්සන

---

කමනි මහේෂිකා
ලේකම්,
පරිසර මිතුරෝ සංවිධානය,
කොළඹ.
2021.05.28

කෘෂි පර්යේෂණ හා සංවර්ධන නිලධාරී,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
කොළඹ 10.

නිලධාරීතුමනි,

<u>ආදර්ශ ගොවිපලක් ආරම්භ කිරීම.</u>

අප ග්‍රාමයේ වෙසෙන ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආදර්ශ ගොවිපලක් ආරම්භ කොට පවත්වාගෙන යාමට තීරණය කොට ඇත.ඒ අනුව බිම් සකස් කර ගැනීම,භෝග තෝරා ගැනීම හා සපයා ගැනීම, භෝග රෝපණය ආදී කරුණු සම්බන්ධයෙන් ඔබතුමගේ උපදෙස් අපේක්ෂා කරමු.පහසු දිනයක් හා වෙලාවක් අපවෙත දැනුම් දී අප ග්‍රාමයට පැමිණ අවශ්‍ය උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූතියි!

මෙයට විශ්වාසී
........................
ලේකම්

ඩබ්.එම්.එස්.එල්.ජයසිංහ

## නිවැරදිව රාජකාරි හා ව්‍යාපාරික ලිපි ලියමු.

- පහත සඳහන් ලිපි ලියන්න.
  1. ඔබ පාසලේ ක්‍රීඩා සමාජයේ ලේකම් යැයි සිතන්න. පාසලේ ක්‍රීඩා උත්සවය 2021.02.19 වන දින යැයි සිතා ඒ සඳහා ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වෙන් කරවා ගැනීමට ප්‍රාදේශීය සභා සභාපතිතුමා වෙත යවන ලිපියක්
  2. රුවන්ගම පාසලේ සිසුන් 100ක් හා ගුරුවරුන් 15ක් ග්‍රහලෝකාගාරය නැරඹීම සඳහා චාරිකාවක් සැලසුම් කර ඇති අතර මේ සඳහා 2021 ඔක්තෝබර් 05වන දින යොදා ගෙන ඇත. ග්‍රහලෝකාගාරය නැරඹීම සඳහා එහි කළමනාකාරතුමාගෙන් අවසර ඉල්ලා ලිපියක්
- හිස්තැන් පුරවා ලිපිය සම්පූර්ණ කරන්න.

රාජේන්ද්‍ර රත්නායක,
ලේකම්,
සුබසාධක සමිතිය,
වීරගම.
2021.05.28

ඩිපෝ අධිකාරිතුමා,
ලංකා ............. ................ මණ්ඩලය,
මන්නාරම.

............................. ,

**<u>වීරගම සිට මන්නාරම් දක්වා බස් රථයක් ලබා ගැනීම සඳහා.</u>**

වීරගම සිට ..................... නගරයට යාමට ........................ නොමැත. මෙනිසා වීරගම පාසල් දරුවන් හා ගම්වාසීන් ........................ 50ක් පමණ ගෙවා මන්නාරමට පා ගමනින් .................. . මෙනිසා ජනතාව ..................වලට මුහුණදෙති.

ස්තුතියි!

මෙයට විශ්වාසී
...................
ලේකම්

ඩබ්.එම්.එස්.එල්.ජයසිංහ